# චීන භික්ෂුණී සමාජයක ආරම්භක සමය පිළිබඳ විමර්ශනයක්

පූජ්‍ය නාඹටුන්නේ විමලඥාණ හිමි

The bhikshuni sangha in China began with Bhikshuni *Ching-chien* who resided in *Zhu Lin Temple* in *Luoyang*. She first received ten precepts from Bhikshu *Zhishan* who was from western China. In the first year of the Sheng Ping era, 357 AD, in the Eastern Jin Dynasty, a foreign bhikshu named *Tan Mo Jie Duo* gave the bhikshuni ordination to *Ching-chien* and other women. Since there were no foreign bhikshunis in China at that time, the ordination was given by the bhikshu sangha alone (single sangha ordination). The first dual sangha ordination in which both bhikshus and bhikshunis participated took place in the 11th year of the Yong Jia era, 434 AD, in the *Liu-Song* Dynasty, with Indian Bhikshu Sanghavarman and Sri Lankan Bhikshuni Devasara and her colleagues granting the ordination. The ordination platform was located in Nanlin Temple. *Ven. Huiguo, Ven. Jing-Yin,* and three hundred others were fully re-ordained.

## 1. හැඳින්වීම

චීන සුන්ග් (*Sung*) අධිරාජ්‍ය යුගය පිළිබඳ රචිත සංක්ෂිප්ත ඉතිහාස වාර්තාවට (*Ta-sung-seng-shih lueh*) අනුව (*A-pan*) අ පන් නම් තැනැත්තිය එරට බිහිවූ පළමු භික්ෂුණියයි. මෙම ප්‍රවෘත්තිය සනාථ කරගැනීම සඳහා සුන්ග් (*Sung*) අධිරාජ්‍ය යුගයේ දී රචිත බෞද්ධ ඉතිහාස වාර්තාව හැර වෙනත් කිසිදු වාර්තාවක් චීන ඉතිහාසයෙන් සොයාගත නොහැකි ය. එසේම ඇය උපසම්පදාව ලද චීන භික්ෂුණියක් වශයෙන් සැළකිය හැකිද යන්න ගැටලුවක්

---

© ආචාර්ය පූජ්‍ය නාඹටුන්නේ විමලඥාණ හිමි

සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අංජලී වික්‍රමසිංහ

මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 21 කලාපය, 2014/2015 මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

වන්නේ එම කාලවකවානුව වනවිට බෞද්ධ විනය ග්‍රන්ථ චීන බසට පරිවර්තනය කර නොතිබුණ බැවිණි. චීන භික්ෂුණී චරිතාපදානය නම් වූ (*Pi-ch'in-ni-chïn*) ග්‍රන්ථයට අනුව ක්‍රි; ව; (335-342) කාලවකවානුව අතර පැවති (*Hsien-kang*) ෂින් කන් යුගයේ චීනයේ බිහිවූ ප්‍රථම භික්ෂුණිය (*Ching-chien*) චින් චෙන් නම් තැනැත්තියයි. කාශ්මීරයේ සිට චීනයට පැමිණි ඥානගිරි හිමියෝ *(Zhishan)* තවත් භික්ෂූන් වහන්සේලා පිරිසක් සමග එක්වී (*Ching-chien*) චින් චෙන් ප්‍රධාන චීන ජාතික කාන්තාවන් විසිහතර දෙනෙක් සාමනේර දසශික්ෂා සමාදන් කරවා සාමණේරී භික්ෂුණීන් ලෙස (*Zhu Lin Temple in Luoyang*) පැවිදි කළහ. මේ යුගය වනවිට භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය මෙන් ම මහාසංඝික නිකායේ විනය ග්‍රන්ථ චීන බසට නගා තිබිණ. එබැවින් මෙම පැවිද්ද භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය මෙන් ම මහාසංඝික විනය පදනම් කරගෙන භික්ෂු සංඝයා පමණක් සහභාගිවී ලබාදුන් බව පැහැදිලිය. ක්‍රි; ව; 357 දී ඉන්දීය ජාතික ධර්මගුප්ත හිමි *(Tan Mo Jie Duo)* චීනයේ ලෝයාන් නගරයට පැමිණියේ චීනයේ පැවැති භික්ෂුණී උපසම්පදා උළෙලක් නියෝජනය කරනු පිණිස ය. මෙම උත්සවය පිළිබඳ දක්වෙන චීන වාර්තාවලට අනුව *Tao-chang* තාඕ චන් නම් චීන ජාතික භික්ෂුව මෙම භික්ෂුණී උපසම්පදා උළෙලට විරුද්ධ වී ඇත. එයට හේතුව ලෙස දක්වෙන්නේ උභය සංඝයා නොමැතිව සාමණේරී භික්ෂුණීන් වහන්සේලා උපසම්පදා කිරීම විනය විරෝධී වන බව චීන ජාතික භික්ෂූන් වහන්සේලා දන සිටීමයි. එලෙස චීන භික්ෂූන් වහන්සේලාගේ විරෝධතා මධ්‍යයේ වුවද උදකුක්ඛේප සීමා මාලයක දී චීන භික්ෂුණී උපසම්පදා උළෙල පවත්වා ඇත. මෙලෙස උපසම්පදාව ලැබූ චීනයේ ප්‍රථම කාන්තාව *Ching-chien* චින් චෙන් නම් වූවාය. චීන භික්ෂුණීන් ප්‍රථමවරට උභය සංඝයා වෙතින් උපසම්පදාව ලැබීම පිළිබඳ පුවත ගුණවර්මන් සහ සංඝවර්මන් භික්ෂු චරිතාපදානවල මෙන් ම (*Pi-ch'in-ni-chïn*) නම් වූ චීන භික්ෂුණී චරිතාපදානයේ දක් වේ. ක්‍රි; ව; 429 දී නන්දි නම් නාවිකයෙක් ශ්‍රී ලාංකික භික්ෂුණීන් අටනමක් කැඳවාගෙන චීනයට පැමිණ තිබේ. මේ පිරිස මුණගැසුණු *Seng-kuo* නම් භික්ෂුණිය සිය ආචාර්යවරයා වූ ගුණවර්මන් හිමි මුණගැසී භික්ෂුණීහු උභය සංඝයා වෙතින් උපසම්පදාව ලබාගැනීම පිළිබඳ කරුණු විමසා තමන් ඇතුලු චීන භික්ෂුණීන්ට ශ්‍රී ලාංකික භික්ෂුණීන් සහභාගී කරවාගෙන උභය සංඝයා වෙතින් උපසම්පදාව ලබාදෙන ලෙස ඉල්ලා සිටියාය. මේ අවස්ථාවේ

ගුණවර්මන් හිමියන් විසින් *Seng –kuo* තෙරණියගේ ඉල්ලීම හේතු දෙකක් මත ප්‍රතික්ෂේප කරන ලදී. එනම් උපසම්පදා උළෙලක් පැවැත්වීමට ශ්‍රී ලාංකික භික්ෂූණීන් අටනම ප්‍රමාණවත් නොවීම සහ ඔවුන්ට චීන භාෂාව පිළිබඳ දැනීමක් නොමැති වීමයි. මෙම හේතුව නිසා හෝ වෙනත් කිසියම් හේතුවක් නිසා හෝ නන්දි නැවත ශ්‍රී ලංකාවට පැමිණ දේවසාරා හෙවත් තෙසරා නම් භික්ෂුණිය ප්‍රධාන භික්ෂුණීන් එකොළොස් නමක් නැවතත් ක්‍රි. ව. 433 දී චීනයට කැඳවාගෙන ගොස් ඇත. මෙම යුගය වනවිට ගුණවර්මන් හිමි අපවත්වී සිටි බැවින් නන්දි විසින් සංඝවර්මන් හිමි වෙත මෙම පිරිස කැඳවාගෙන යන ලදී. ක්‍රි. ව. 429 දී චීනයට පැමිණි ශ්‍රී ලාංකික භික්ෂූණීන් අටනම වසර හතරක් ඉක්මයනවිට චීන භාෂාව පිළිබඳව ද මනා පරිචයක් ලබා සිටි බැවින් සංඝවර්මන් හිමි ප්‍රධාන දේශීය හා විදේශීය භික්ෂු සංඝයා ශ්‍රී ලාංකික භික්ෂුණීන් දහනව දෙනාද සහභාගී කරවාගෙන චීන ජාතික කාන්තාවන් 300 දෙනෙක් පමණ *Nan-lin* නන් ලින්ග් ආරාමයේ දී උපසම්දා කළහ. මෙය චීන ජාතික කාන්තාවන් පළමුවරට උභය සංඝයා වෙතින් ලද උපසම්පදාව ලෙස ඓතිහාසික චීන බෞද්ධ ග්‍රන්ථවල දක් වේ. මෙම නිබන්ධයේ ප්‍රධාන අරමුණ වන්නේ ප්‍රථමවරට චීන ජාතික කාන්තාවන් ශ්‍රී ලාංකික භික්ෂූණීන් වහන්සේලාගේ සහභාගී වූ උපසම්පදා උළෙලේ දී උභය සංඝයා වෙතින් ලැබියයුතු උපසම්පදාව ලත්බැව් තහවුරු කිරීමය. එසේම වර්තමානය දක්වා අඛණ්ඩව මෙම භික්ෂුණී උපසම්පදාව පවතින බවත් ආරම්භයේ සිට වර්තමානය දක්වා චීන භික්ෂුණීන් විසින් හීනයාන සම්ප්‍රදාය නියෝජනය වන විනය අනුගමනය කරන බැවින් ශ්‍රී ලාංකේය භික්ෂුණී සමාජය ප්‍රතිසංවිධානය කිරීමේ දී චීන භික්ෂුණීන්ගේ සහයෝගය ලදහැකි බව පෙන්වා දීමත්ය.

මුඛ්‍ය පද :- චීන භික්ෂුණිය, භික්ෂුණී විනය, නන්දි, දේවසාරා,

## 2. බුදුසසුනෙහි පැවිදි වූ චීන ජාතික පළමු කාන්තාව

චීන සුන්ග් (*Sung*) අධිරාජ්‍ය යුගය පිළිබඳ රචිත *Ta - sung Seng - Shih Lueh* සංස්ක්ෂිප්ත ඉතිහාස ග්‍රන්ථයේ දක්වෙන පරිදි භික්ෂුණියක් ලෙස පැවිද්ද ලැබූ පළමු චීන ජාතික කාන්තාව අ පන් (*A-Pan*) නම් වේ.[1] ඇයගේ ජීවන චරිතය පිළිබඳ ව හෝ කාලවකවානුව පිළිබඳ වෙනත් කිසිදු චීන වාර්තාවකින් තොරතුරු සොයා ගත නොහැක.

3rd Proof



මේ කාලය වන විට කිසිදු බෞද්ධ විනය ග්‍රන්ථයක් චීන බසට පරිවර්තනය වී නොපැවතිණි. එබැවින් අ පන් (*A-Pan*) තෙරුවන් සරණයාම හැර වෙනත් අදාළ ශික්ෂාවන් සමාදන් වූ බවට සාධක ඉදිරිපත් කළ නොහැකි ය. පළමුවෙන් ම චීන බසට විනය ග්‍රන්ථ පරිවර්තනය කරන ලද්දේ මධ්‍ය ආසියානු ජාතික විනයාචාර්ය ධර්මකාල හිමියන් විසිනි.[2] එතුමාගේ ජීවන තොරතුරු අනුව උන්වහන්සේ *Chen – Pin* චෙන් පින් කාලවකවානුවේ හෙවත් ක්‍රි; ව; 249-253 අතර ලෝයාන් අගනුවර ආශ්‍රමයක වාසය කරමින් බෞද්ධ විනය ග්‍රන්ථ පරිවර්තන කාර්ය සිදු කර තිබේ. එතුමා විසින් මහාසංඝික නිකායට අයත් විනය ග්‍රන්ථ *Seng - Chin Chieh -hsin* පරිවර්තනය කරන ලදී. 254 දී විනයාචාර්ය ධර්ම සත්‍යය හිමියන් විසින් ධර්මගුප්ත විනය ග්‍රන්ථ පරිවර්තනය කරන ලදී.

මෙම ඓතිහාසික තොරතුරුවලින් සනාථ වන්නේ මහාසංඝික හෝ ධර්මගුප්ත විනය ග්‍රන්ථ හඳුන්වා දීමට පෙර චීනය තුළ භික්ෂුණී සංස්ථාව ආරම්භ විය නොහැකි බවයි. කිසි යම් චීන ජාතික කාන්තාවක් භික්ෂුණියක් වශයෙන් පැවිදි උපසම්පදාව ලැබීමට නම් විනය ග්‍රන්ථ චීනයට හඳුන්වා දී තිබිය යුතු ය. එහෙත් *A-Pan* පිළිබඳ වාර්තාවන්ගේ මෙම පරිවර්තනයන්ට පෙර ය.

### 3. භික්ෂූන් වෙතින් පමණක් ලද විනයානුකූල පැවිදි උපසම්පදාව

කෙසේ වුව ද චීන ජාතික කාන්තාවක් විනයානුකූලව පැවිදි උපසම්පදාව ලැබූ බවට ඓතිහාසික වාර්තාවලින් සනාථ වන්නේ මෙම සිදුවීම්වලින් සියවස් දෙකකට පසු ක්‍රි. ව. 434 දී ය.[3] භික්ෂුණී චරිතාපදානය නම් ග්‍රන්ථයේ පළමු චීන භික්ෂුණිය පිළිබඳ තොරතුරු වාර්තා වේ. ඇය *Ching - Chien* චින් චෙන් නම් විය. රාජකීය අමාත්‍යවරයෙකුගේ දියණියක ලෙස උපත ඇය ළමා අවධියේ සිට ම ඉගෙනීමට දක්ෂ වූවාය. සංගීතය, ලිවීම කියවීම පිළිබඳ මනා පරිචයක් ලැබුවාය. මේ අතර බුදුදහම ඉගෙනීමට ද ආරම්භ කළාය. එහෙත් ඒ සඳහා ඇයට ආචාර්යවරයෙක් සොයාගත නොහැකි විය. බොහෝ කලකට පසු ඇයට පා ෂිහ් *Fa-Shih* නම් බෞද්ධ භික්ෂුව මුණ ගැසිණි. එතුමා බෞද්ධ මූලග්‍රන්ථ පිළිබඳ මනා පරිචයක් ලද

භික්ෂුවකි. Ching - Chien ඉන්පසු Fa-Shih යටතේ බෞද්ධ අධ්‍යාපනය හැදෑරීය. එක් දිනක් ඇය සිය ආචාර්යවරයා වූ Fa- Shih අමතා මෙසේ පැවසුවාය. ''බෞද්ධ මූලාග්‍රන්ථවල භික්ෂු හා භික්ෂුණී යන උභය සංඝයා පිළිබඳ තොරතුරු දක් වේ. මට ද භික්ෂුණියක ලෙස පැවිදි වීමට අවශ්‍ය ය. මෙය ඇසූ Fa-Shih හිමියන් ඉන්දියාවේ භික්ෂු - භික්ෂුණී උභය සංඝයා සිටින බව පැවසුවේය. එවිට Ching- Chien විමසා සිටියේ භික්ෂූන් වහන්සේ හා භික්ෂුණීන් වහන්සේ පැවිදි උපසම්පදා කිරීමේ වෙනස කුමක් ද යන්නයි. එවිට Fa- Shih හිමි පිළිතුරු දෙමින් තමාට විදේශීය භික්ෂූන් වහන්සේ නමක් භික්ෂුණීන් වහන්සේලා විසින් සමාදන් විය යුතු ශික්ෂා පද පන්සියයක් පමණ ඇති බව පැවසූහයි ප්‍රකාශ කළේය. කෙසේ වුව ද Fa- Shih හිමියන් භික්ෂුණී විනය ශික්ෂා විමසා බලා Ching-Chien පැවිදි කිරීමට පොරොන්දු විය. ඉන් අනතුරුව Fa- Shih හිමි කාශ්මීරයෙන් චීනයට පැමිණ සිටි ඥානගිර හිමියන්ගෙන් භික්ෂුණී විනය පිළිබඳ විමසීය. එවිට ඥානගිර හිමියන් පිළිතුරු දෙමින් භික්ෂුණී විනය නීති ප්‍රධාන වශයෙන් භික්ෂු විනය නීතිවලට සමාන බවත් සුළු වෙනස්කම් කිහිපයක් පමණක් පවතින බවත් පැවැසීය. නමුත් පොදු සම්මතයකින් තොරව කිසිවෙකුවත් විනය නීති පිළිබඳ තීරණ ගැනීම කළ නොහැකි බවත් උන්වහන්සේ දන්වීය. තව දුරටත් ඥානගිර හිමියන් පවසා සිටියේ කාන්තාවකට භික්ෂූන් වහන්සේ වෙතින් දස සිල් සමාදන් විය හැකි බවයි. තමා ඉගෙනගත් විනයනීතවලට අනුව එම දස සිල් සමාදන් වීමෙන් භික්ෂුණියක විය නොහැකි බව ද පැවසීය. කෙසේ වුව ද Ching - Chien ප්‍රධාන චීන ජාතික කාන්තාවන් 24 දෙනෙක් ඥානගිර හිමියන් වෙතින් දසසිල් සමාදන් වී සාමණේරීන් වහන්සේලා බවට පත් වූවාය. [4] ඉහත සඳහන් ඓතිහාසික සිදුවීම් දෙකට අනුව Sung රාජ්‍ය සමයේ විසූ A- Pan නම් චීන කාන්තාව තෙරුවන් සරණ ගිය උපාසිකාවක් ලෙස ජීවත් වූ ආකාරයත් ක්‍රි. ව. 3 වැනි සියවසේ විසූ Ching - Chien ප්‍රමුඛ චීන කාන්තාවන් විසි හතර දෙනා දසසිල් මාතාවන් හෙවත් සාමණේරින් ලෙස පැවිද්ද ලැබූ අයුරුත් පැහැදිලි ය.

චින් Chin අධිරාජ්‍යයේ සින් කන්ය sien - kang රාජ්‍ය සමයේ ක්‍රි. ව. 335-342 චීන ජාතික භික්ෂුවක වූ සෙන් චින් Seng - Chien මධ්‍යම ආසියාවේ සිට මහාසංඝික භික්ෂු විනය කර්ම සහ භික්ෂුණී

ප්‍රාතිමෝක්ෂය චීනයට හඳුන්වා දෙන ලදී.[5] ෂන් පින් *Shen - Ping* පාලනයේ පළමු වසරේ හෙවත් ක්‍රි. ව. 357 දී ඉන්දියානු ජාතික භික්ෂුවක වූ ධර්මගුප්ත හිමියන් චීනයෙන් ලද ඇරයුමකින් ලෝයාන් නුවරට පැමිණ භික්ෂුණීන් පැවිදි උපසම්පදා කිරීම සඳහා මූලික පදනම් සකස් කළේය. [6] නමුත් චීන ජාතික භික්ෂුවක වූ තාඔ චන් *Tao ch' ang* විසින් *Chien - yin - yin - ching* හෙවත් *Sutra of the Origin of Rules* නම් මූලික විනය නීති ඇතුළත් සූත්‍ර ඉගැන්වීම්වලට අනුව මෙලෙස භික්ෂුණී උපසම්පදා උළෙලක් පැවැත්වීම විනය විරෝධී බව පෙන්වා දෙන ලදී. මෙම විරෝධතාවට හේතුව වන්නට ඇත්තේ ඒ වන විට චීනයේ භික්ෂූන් වහන්සේලා සිටිය ද භික්ෂුණී ශාසනය පිහිටුවීම සඳහා සුදුසු භික්ෂුණීන් නොසිටි නිසා විය හැකි ය. මෙම හේතුව නිසා භික්ෂුණී උපසම්පදාව කල් ගියේය. කෙසේ වුවත් පසුව *Ching - Chien* ප්‍රධාන සාමණේරීන් වහන්සේලා පිරිස උපසම්පදා කිරීමට තීරණය විය. ගඟ මැද නැවක් රඳවා ඒ තුළ උපසම්පදා විනය කර්මය සිදු කෙරිණි. එහි දී *Ching - Chien* ප්‍රධාන තවත් සාමණේරීවරු තිදෙනෙක් පළමුවරට භික්ෂු සංඝයා වෙතින් උපසම්පදාව ලැබුවාය. සියලු විනය නීතිවලට අනුව භික්ෂුණී උපසම්පදාව භික්ෂු සංඝයා පමණක් සහභාගී වී සිදු කළ නොහැක. උභය සංඝයා එක් ව සිදු කළ යුතු ය. මෙලෙස භික්ෂූන් වෙතින් පමණක් ලද අසම්පූර්ණ වූ භික්ෂුණී උපසම්පදා ක්‍රමය අඩසියවසකට වැඩි කාල සීමාවක් චීනයේ ක්‍රියාත්මක විය.

### 4. උභය සංඝයා වෙතින් පැවිදි උපසම්පදාව ලැබීම

චීන භික්ෂුණීහු උභය සංඝයා වෙතින් පැවිදි උපසම්පදාව ලැබීම පිළිබඳ පැරණිතම වාර්තා ගුණවර්මන්, සංඝවර්මන් සහ *Pi - Ch' in - ni - Chuan* හෙවත් භික්ෂුණී චරිතාපදාන තුළින් අනාවරණය කර ගත හැකි ය. [8] ගුණවර්මන් හිමියෝ කාශ්මීරයේ සිට චීනයට පැමිණි විනයාචාර්යවරයෙකි. එතුමාණෝ ක්‍රි. ව. 430 දී චීනයේ *Yang - Chou* ප්‍රදේශයට පැමිණ විනය ග්‍රන්ථ රැසක් චීන බසට නැගූහ. [9] ඉන්දියාවේ සිට ක්‍රි. ව. 434 දී *yang - Chou* ප්‍රදේශයට පැමිණි විනයාචාර්ය සංඝවර්මන් හිමියන් විසින් ද විනය ග්‍රන්ථ රැසක් චීන බසට නගන ලදී. මේ දෙදෙනා වහන්සේ පිළිබඳ තොරතුරු *Kao - seng - Chuan* හෙවත් විශිෂ්ට භික්ෂු චරිතාපදාන නම් කෘතියේ දැක් වේ. [10] මෙම චරිතාපදානවල චීන භික්ෂුණීහු උභය සංඝයා වෙතින්

උපසම්පදාව ලද අයුරු පැහැදිලි ව ම සටහන් වේ. කෙසේ වුව ද උභය සංගයා වෙතින් චීන භික්ෂුණීහු පැවිදි උපසම්පදාව ලැබූ බව සෘජුව ම හා වඩා ප්‍රමුඛව ඉදිරිපත් කරන වාර්තාව ලෙස චීන භික්ෂුණී චරිතාපදාන ග්‍රන්ථයේ දැක්වෙන seng - kuo භික්ෂුණියගේ චරිතාපදානයෙහි එන තොරතුරු වඩාත් වැදගත් වේ. seng - kuo භික්ෂුණිය පිළිබඳ වාර්තාවේ ඇයගේ සුවිශේෂ චරිත ලක්ෂණ රැසක් දැක් වේ. ඇය භික්ෂුණියක ලෙස පූර්ණ උපසම්පදාව ලැබීමට පෙර බුදුදහම මැනවින් ප්‍රගුණ කළ අතර ඉටු කළ යුතු වතාවත් ද නිසි පරිදි සම්පූර්ණ කළාය. ඇය කුඩා අවධියේ පටන් ම ආරාමීය විනය නීති පිළිපැද්ද අතර විකාල භෝජනයෙන් ද වැළකී සිටියා ය. ඇයට වසර විසිහතක් යන තෙක් ගිහිගෙයින් නික්ම යාමට අවසර නොලැබිණි. ඇය බෞද්ධ භාවනා ක්‍රම මැනවින් ප්‍රගුණ කර උසස් මානසික හැකියාවක් වර්ධනය කර ගෙන තිබුණි. ඇයට භාවනාව මගින් සිත සමාධිගත කර ගෙන තම සිරුර ඉදිරියේ මනෝ කායකින් පෙනී සිටිමින් සිය කරජකාය දෙස බලා සිටීමේ හැකියාව ද ලැබිණි. [11] ඇය උභය සංඝයා වෙතින් පූර්ණ උපසම්පදාව ලබා ගන්නා විට කොතෙක් දුරට ධර්මය හදාරා එය ප්‍රගුණ කර සිටියේ ද යන්න ඇයගේ චරිතාපදානයෙන් විස්තර කර ඇත.

ක්‍රි. ව. 429 දී නන්දි නම් නාවික නිලධාරියා ශ්‍රී ලාංකේය භික්ෂුණීන් වහන්සේ අටනමක් රැගෙන  ශ්‍රී ලංකාවේ සිට නැවකින් චීනයට පැමිණියේය. එසේ පැමිණි ශ්‍රී ලාංකේය භික්ෂුණීහු ching - fu - ssu නම් ආශ්‍රමයේ නැවතී සිටියහ. නොබෝ දිනකින් එම භික්ෂුණීහු seng - kuo භික්ෂුණිය හමු වී අප මෙහි පැමිණීමට පෙර විදේශීය භික්ෂුණීහු මෙහි පැමිණ සිටියේ දැයි විමසූහ. එහට seng - kuo ගේ පිළිතුර වූයේ එසේ නොපැමිණි බවයි. එය ඇසූ ශ්‍රී ලාංකේය භික්ෂුණීහු එසේනම් චීන භික්ෂුණීහු උභය සංඝයා වෙතින් කෙසේ උපසම්පදාව ලැබුවේ දැයි ප්‍රශ්න කළහ. එයට seng - kuo පිළිතුරු දෙමින් ප්‍රකාශ කර සිටියේ අප භික්ෂු සංඝයා වෙතින් පමණක් උපසම්පදාව ලැබූ බවයි. [12] ශාසනික ප්‍රතිපදාව ආරක්ෂා කළ මෙම කාන්තාවෝ ආරාමීය විනය නීතිරීතිවල මූලික අංග ආරක්ෂා කළහ. මෙලෙස මූලික විනය ශික්ෂාවන් ආරක්ෂා කළ කාන්තාවන්ට ආරාමීය ජීවිතයක් ගත කළ බැවින් සාමාන්‍ය ජනයා උසස් ලෙස ගරු කිරීමට පටන් ගත්තේ ය. අප මේ සඳහා උදාහරණ ලෙස මුල් කර ගත්තේ බුදුන් වහන්සේගේ

සුළු මව වන ප්‍රජාපතී ගෝතමියයි. මහා ප්‍රජාපතී ගෝතමිය තමන් විසින් ම අටසිල් සමාදන් වී කසාවත් හැද ආරාමීය ජීවිතයක් ගත කළ අතර ඇය අනුගමනය කළ ක්ෂත්‍රිය කාන්තාවෝ විශාල පිරිසක් ආරාමීය ජීවිතයට නැඹුරු වූහ. මෙම විස්තරය ශ්‍රී ලාංකේය භික්ෂුණීන් වෙත ඉදිරිපත් කළ *seng - kuo* චීන භික්ෂුණිය සංඝයා වෙතින් ලද උපසම්පදාවෙහි නිරවද්‍යතාව යුක්ති සහගත කළාය. මෙම සංවාදයෙන් අනතුරුව *seng - kuo* භික්ෂුණිය එවකට ශ්‍රේෂ්ඨ විනයාචාර්යවරයෙකු ලෙස චීනයේ ප්‍රකට ව සිටි ගුණවර්මන් හිමියන් හමු වී මතු වූ තත්ත්වය පිළිබඳ තොරතුරු දැන්වූවාය. ඇය තව දුරටත් විමසා සිටියේ නැවත චීන භික්ෂුණීන් උපසම්පදාව ලැබිය යුතු ද යන්නයි. චීන භික්ෂුණීහු භික්ෂු සංඝයා වෙතින් ලද උපසම්පදාවෙහිවලංගුතාව පිළිබඳ ඇති වූ ගැටලුකාරී ස්වභාවය පිළිබඳ පිළිතුරු දුන් විනයාචාර්ය ගුණවර්මන් හිමි; ''භික්ෂු සංඝයා විසින් භික්ෂුණී උපසම්පදාව ලබා දීම මූලික විනය හා ධර්ම කරුණු අනුව ද සපුරා අනුමත කළ නොහැකි ය. මහාප්‍රජාපතී ගෝතමියගේ ක්‍රියා කාරිත්වය පදනම් කරගෙන චීන භික්ෂුණියගේ උපසම්පදාව සාධාරණීයකරණය කිරීමෙන් ලද හැකි ප්‍රතිඵල අවම ය. '' මෙම ප්‍රකාශය ඇසූ *seng - kuo* ගුණවර්මන් හිමිගේ පිළිතුරට ගරු කරමින් ප්‍රශ්න කර සිටියේ නැවත චීන භික්ෂුණීහු උපසම්පදාව ලැබීමට සුදුසු ක්‍රියාමාර්ග මොනවාද යන්නයි. මෙයට පිළිතුරු දුන් විනයචාර්ය ගුණවර්මන් හිමියෝ එය ඉතා හොඳ බවත්, ඔබ ඔබගේ විමුක්ති මාර්ගය තව දුරටත් හොඳින් අනුගමනය කිරීමට නැවත උපසම්පදාව ලැබීමට කැමැත්තේ නම් මම සත්‍ය වශයෙන් ම ඉතා සතුටින් ඔබට උදව් කරන බවත් දන්වා සිටියහ. එසේ වුව ද ශ්‍රී ලංකාවෙන් චීනයට පැමිණි භික්ෂුණීන් උපසම්පදාවෙන් තවම තිසි වයස් සම්පූර්ණ කර නොමැති බවත් පැමිණි පිරිස දසනමකට වඩා අඩු බවත් ප්‍රකාශ කොට පළමුවෙන් එම භික්ෂුණීන් චීන භාෂාව ප්‍රගුණ කිරීම සුදුසු බව දන්වා සිටියහ.[13] මෙම සිදුවීමෙන් වසර 4 ට පසු එනම් ක්‍රි. ව. 433 දී නැවත නන්දි නම් නාවිකයා ශ්‍රී ලාංකාවේ සිට *Tessara* භික්ෂුණියගේ ප්‍රධානත්වයෙන් යුත් භික්ෂුණීන් වහන්සේලා එකොළොස් නමක් වැඩමවාගෙන චීනයට පැමිණියේ ය. මෙම *Tessara* තෙසරා භික්ෂුණිය දේවසාර යන නමින් ද චීන මූලාශ්‍රයවල දක් වේ.[14] මෙම භික්ෂුණී පිරිස පැමිණෙන විට මුල්වතාවේ පැමිණි භික්ෂුණී කණ්ඩායම චීන බස මැනවින් ප්‍රගුණ කර සිටියෝය. එමෙන්

ම ගුණවර්මන් හිමි මේ වන විට අපවත් වී සිටියේය. එසේ වුවත් *Seng - Kuo* භික්ෂුණිය ප්‍රධාන අනෙක් චීන භික්ෂුණීහු ඉන්දීය ජාතික විනයාචාර්ය සංඝවර්මන් හිමියන් හමු වී ගුණවර්මන් හා ශ්‍රී ලාංකේය භික්ෂුණීන් හමු වී පැවැත්වූ සාකච්ඡා සහ එහි දී පැමිණි එකඟතා පිළිබඳ දන්වා සිටියෝ ය. මෙ කරුණු මත සංඝවර්මන් හිමිගේ උපදෙස් මත *Nan - lin* ආශ්‍රමයේ දී භික්ෂුණී උපසම්පදා විනය කර්මය සිදු කිරීමට කටයුතු සංවිධානය විය. මේ සඳහා ශ්‍රී ලාංකික භික්ෂුණීහු (19) දහනම නමක් සහභාගී කරගත් අතර සංඝවර්මන් හිමි ඇතුළු භික්ෂූහු විශාල පිරිසක් සහභාගී වූහ. ක්‍රි. ව. 434 දී *Nan-lin* විහාරයේ දී උභය සංඝයා වෙතින් චීන ජාතික කාන්තාවෝ තුන්සියයක් පමණ උපසම්පදාව ලැබුවෝය. මෙය පළමුවරට උභය සංඝයා වෙතින් චීන ජාතික කාන්තාවන් පැවිදි උපසම්පදාව ලැබීමයි.[15] උභය සංඝයා වෙතින් චීන ජාතික කාන්තාවන් පැවිදි උපසම්පන් වී භික්ෂුණී සංස්ථාව ආරම්භ වීම පදනම් කොට කරුණු දෙකක් පැහැදිලි කර ගත හැකි ය.

එනම්

1. චීන ජාතික කාන්තාවන් පැවිදි උපසම්පදා කිරීම භික්ෂු සංඝයා පමණක් සහභාගී වී සිදු කිරීම *Ching - Chien* භික්ෂුණිය දක්වා (ක්‍රි. ව. 357) වලංගු විය. එසේ ම එය පිරිසිදු මහණ උපසම්පදාව ලෙස සැලැකුණි. විවිධ බෞද්ධ ගුරුකුලවල විනය මූලධර්මවලට අනුව උභය සංඝයා වෙතින් කාන්තාවන් පැවිදි උපසම්පදා කරීම විනිය විරෝධී නො වේ. එසේ වුව ද භික්ෂූන්ගෙන් හෝ භික්ෂුණීන්ගෙන් හෝ පමණක් පැවිදි උපසම්පදාව ලැබීම විනයට එකඟ නො වේ. ඒ අනුව එක් පාර්ශ්වයකින් ලබන පැවිදි උපසම්පදාව නීත්‍යානුකූල නැත.
2. චීන කාන්තාවන් භික්ෂු හා භික්ෂුණී සංඝයා වෙතින් පැවිදි උපසම්පදාව ලැබීම පිළිබඳ ඉතිහාසය පරීක්ෂා කිරීමේ දී එය ක්‍රි. ව. 434 දී සිදු වූ බව ලිඛිත සාධක අනුව ශ්‍රී ලංකාවෙන් දෙවැනි වරට භික්ෂුණීන් වහන්සේලා 11 නමක් චීනයට ගිය පසු ඊට පෙර චීනයට ගිය ශ්‍රී ලාංකික භික්ෂුණීන් අට නම ද සමග භික්ෂුණීන් දහනම නම එක් වී *seng - Kuo* ඇතුළු චීන ජාතික භික්ෂුණීන් උපසම්පදා කළහ. මෙම විනය කර්මය

සඳහා සංඝවර්මන් ප්‍රධාන භික්ෂු සංඝයා ද සහභාගී වූහ. මෙය චීන භික්ෂුණී ශාසනයෙහි පළමු උභය සංඝයාගෙන් ලද උපසම්පදාවයි. එබැවින් චීන භික්ෂුණී ශාසනය විනයානුකූල ව පිහිටුවීම ක්‍රි. ව. 434 දී *Nan-lin* ආශ්‍රමයේ දී සිදු කෙරිණි. මෙහි ප්‍රමුඛත්වය *Tessara* හෙවත් දේවසාර නම් ශ්‍රී ලාංකික භික්ෂුණිය ප්‍රමුඛ කණ්ඩායම දරන ලද අතර සංඝවර්මන් හිමි භික්ෂු පිරිසෙහි නායකත්වය දැරීය.

## 5. චීන භික්ෂුණී සමාජය ආරම්භක යුගයේ අනුගමනය කල විනය ශික්ෂාවල ස්වභාවය

චීනයට නිල වශයෙන් බුදුදහම ලැබුණු පළමු සියවසේ සිට ම හීනයාන හා මහායාන සම්ප්‍රදායවලට අයත් පාලි හා සංස්කෘත සූත්‍ර චීන බසට පරිවර්තනය කළ ද විනය ග්‍රන්ථ පිළිබඳ එතරම් අවධානයක් නොලැබිණ. කෙසේ වුව ද චීන ඓතිහාසික වාර්තාවලට අනුව පළමුව එරටට ලැබී ඇත්තේ ධර්මගුප්ත නිකායට අයත් විනය ග්‍රන්ථයි. පස්වැනි සියවසේ මුල් කාර්තුව වන විට විනය ග්‍රන්ථ රැසක් චීන බසට නගා තිබුණි.

එනම්,

I. ක්‍රි. ව. 422-423 අතර *Hui - Yen, Chu - Tao Sheng* සහ බුද්ධජීව යන හිමිවරුන් විසින් මහා සාංඝික විනය ග්‍රන්ථ චීන බසට නැගීම.
II. ක්‍රි. ව. 416-418 අතර බුද්ධභද්‍ර සහ *Fa-sien* යන හිමිවරුන් විසින් මහාසංඝික විනය ග්‍රන්ථ චීන බසට නැගීම.
III. ක්‍රි. ව. 410-412 අතර බුද්ධභද්‍ර සහ *Chu F£ien* යන හිමිවරුන් විසින් ධර්මගුප්ත විනය චීන බසට නැගීම.
IV. ක්‍රි. ව. 404-409 අතර පුණ්‍යත්‍රාත කුමාරජීව සහ ධර්මරුචි යන හිමිවරුන් විසින් සර්වාස්තිවා දී විනය ග්‍රන්ථ චීන බසට නැගීම.
V. විමලාක්ෂ හිමියන් විසින් ප්‍රාතිමෝක්ෂ සූත්‍ර නම් විනය ග්‍රන්ථය චීන බසට නැගීම. [16]

මෙම වාර්තාවලට අනුව ක්‍රි. ව. 423 වන විට මහා සාංඝික, ධර්මගුප්ත, සහ සර්වාස්තිවා දී විනය ග්‍රන්ථ චීන බසට නගා ඇත. මේ අනුව ක්‍රි. ව. 429

දී සහ 433 දී ශ්‍රී ලාංකික භික්ෂුණීන් කණ්ඩායම් දෙකක් චීනයට පැමිණියේ චීන සංඝ සංස්ථාව උක්ත නිකායන්හි විනය නීති අධ්‍යයනය කරමින් හා අනුගමනය කරමින් සිටින අවධියේය.[17] ඒ අනුව ක්‍රි. ව. 433 දී *Nan - lin* ආරාමයේ දී පළමුවරට චීන ශික්ඛා මානවිකාවන් හා භික්ෂූන් වෙතින් උපසම්පදාව ලබා සිටි සියලු චීන භික්ෂුණීන් උභය සංඝයා වෙතින් උපසම්පදාව ලැබුවේ ධර්ම ගුප්ත, මහා සාංඝික, සර්වාස්තිවා දී හා ථෙරවා දී විනය නීතිරීතිවලට අනුගතව ය. චීනයේ දී පළමුව පැවිදි වූ කාන්තාව සාමණේරී භික්ෂුණියක් ලෙස පැවිද්ද ලබා ගැනීමේ දී උපාධ්‍යායවරියක් නොසිටිය ද භික්ෂු උපාධ්‍යවරයෙක් ඉදිරියේ ධර්මගුප්ත විනයට අනුව ප්‍රතිපත්ති රැකීමට පොරොන්දු වී ඇත.[18] ඒ වන විට ඇය සාමණේර භික්ෂුණියක් බවට පත්වීමේ මූලික සුදුසුකම් ලබා තිබුණි.

එනම්

I. අවම වශයෙන් වයස අවුරුදු 12 සම්පූර්ණ වී තිබීම.
II. සාමණේරින් වහන්සේ නමකට අදාළ දස ශික්ෂාපද පිළිගැනීම හා පිළිපැ දීම.
III. ඒකාසන භෝජනය[19]

මෙලෙස ශික්ෂණය ලබන තැනැත්තිය සික්ඛා මානවිකා තනතුරට පත්වීමට ද සපුරාලිය යුතු ගුණාංග කිහිපයක් ධර්මගුප්ත හා අනෙක් නිකායයන්හි විනය ග්‍රන්ථයන්හි විස්තර කොට ඇත. මෙ නිකායන්ට අදාළ විනය නීති චීන භික්ෂුණීන් අනුගමනය කළ බැවින් ඔවුන් දෙවැනි පියවරේ දී අනුගමනය කළ ප්‍රතිපත්ති විමසා බැලීම ද වැදගත් වේ. ධර්ම ගුප්ත විනය නීතිවලට අනුව සාමණේරී තත්ත්වයේ සිටින තැනැත්තිය වයස අවුරුදු 18 සම්පූර්ණ වූ පසු ඇයගේ උපාධ්‍යායවරිය විසින් සංඝයා ඉදිරියේ ශික්ෂාමානවිකා තත්ත්වයට පත් කෙරේ. ඉන් අනතුරුව ඇය වසර දෙකක පමණ කාලය ශික්ෂාමානවිකාවක ලෙස ප්‍රතිපත්ති පුරයි. මේ සඳහා හේතු දෙකක් බලපායි.

එනම්

I. භික්ෂුණියක ලෙස කටයුතු කිරීම සඳහා අවශ්‍ය පුහුණුව ලැබීම.
II. ඇය ගැබිණියක් නොවන බව තහවුරු කරගැනිම.[20]

මූල සර්වස්තිවාද විනය ග්‍රන්ථවල ද වයස අවුරුදු 18 සිට 20 දක්වා කාලය සික්ඛාමානවිකාවක ලෙස ගත කිරීමේ හේතු දක්වා ඇත. එනම්

I. සංඝ සමාජයට සම්බන්ධ වූ පසු තරුණ කාන්තාවන් නොදැනුවත් කමින් සිදු කරන වැරදි හැසිරීම් වළකාලීම.
II. විනය කර්ම පිළිබඳ මහා පරිචයක් ලබා ගැනීම. මෙය බුදුන් වහන්සේ විසින් [21] අනුදත් පිළිවෙතයි. මෙයට අමතරව විනය ග්‍රන්ථයන්හි වෙනත් හේතුන් ද දකවා ඇත. එක් අවස්ථාවක භික්ෂුණියක විසින් ගැබ්ගත් කාන්තාවක් පැවිදි කරන ලදී. මෙම තත්ත්වය ප්‍රකට වීමෙන් පසු භික්ෂුණිය ගැබ් ගැනීමට හේතුව භික්ෂූන්ගේ ක්‍රියාවක් බව පවසමින් විවිධ පුද්ගලයෝ සංඝයාට චෝදනා කළහ. මේ බව භික්ෂූන් විසින් බුදුන් වහන්සේට දැන්වන ලදි. එවිට බුදුන් වහන්සේ දන්වා සිටියේ එතැන් පටන් සාමණේරිකාවන් දෙවසරක් පුරා ධර්ම හයක් ප්‍රගුණ කළ යුතු බවයි. එම කාලය තුළ ඇය ගැබිණියක් වන්නේ ද නැතිනම් එසේ නොවන්නේදැයි පහසුවෙන් විනිශ්චය කළ හැකි බවයි.[22]

සාමණේරිකාවක් වශයෙන් ශික්ෂාපද දහයක් ආරක්ෂා කළ යුතු වීන භික්ෂුණීහු සික්ඛා මානවිකාවන් ලෙස කටයුතු කිරීමේ දී තවත් ධර්ම හයක් පිළිපැදිය යුතු ය. මෙම සික්ඛා මානවිකා ධර්ම හය විවිධ නිකායවල එකිනෙකට වෙනස් ලෙස ඉදිරිපත් කර ඇත. [23] ධර්මගුප්ත විනය ග්‍රන්ථවල එම ධර්ම හය මෙසේ දැක් වේ.

I. රාගික සිතින් පුරුෂයෙකු ස්පර්ශ නොකිරීම.
II. සොරකම් කිරීමෙන් වැළකීම.
III. ප්‍රාණඝාතයෙන් වැළකීම.
IV. මුසාවාදයෙන් වෙන් වීම.
V. නියමිත කාලයේ ආහාර ගැනීම.
VI. විනය නීති පිළිපැදීම.[24]

මූල සර්වස්ථිවාදී විනය ග්‍රන්ථවල ධර්ම හයක් සහ අනුධර්ම හයක් ද ඉදිරිපත් කෙරේ. එහි දැක්වෙන ධර්ම හය නම්,

I. හුදෙකලාව පාර දිගේ නොයා යුතු ය.
II. හුදෙකලාව මහමග ගමන් නොකළ යුතු ය.

III. පුරුෂයෙකුගේ සිරුර ස්පර්ශ නොකළ යුතු ය.
IV. පුරුෂයකු සමග එක කාමරයක හුදෙකලාව නොහිදිය යුතු ය.
V. විවාහ කටයුතු සංවිධානය නොකළ යුතු ය.
VI. භික්ෂුණී පාරාජිකා නොඉක්මිය යුතු ය. [25]

මෙයට අමතරව අනුධර්ම වශයෙන් කොටස් හයක් ඉදිරිපත් කෙරේ. එනම්

I. රන් රිදී නොපිළි ගැනීම
II. නියමිත පරිදි හිස බෑම
III. පොළොව නොහෑරීම
IV. ගස් හා තණකොළ නොකැපීම
V. නොපිළිගැන්වූ දෙයක් නොවැළඳීම[26]

කිසියම් ශික්ෂා මානවිකාවක් ඉහත දැක්වූ ප්‍රතිපත්ති කඩන්නේ නම් තවත් වසර දෙකක් ශික්ෂා මානවිකාවක ලෙස පුහුණු කළ යුතු බව ධර්මගුප්ත විනයෙහි විස්තර වේ. කිසියම් චීන භික්ෂුණියක් සාමණේරියක වශයෙන් නොසිට ශික්ෂා මානවිකාවක් වීම අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා භික්ෂුණී සංඝයාගෙන් අවසර ලැබිය යුතු ය. ශික්ෂා මානවිකාවක් උපසම්පදා කිරීම සඳහා ඇයගේ උපාධ්‍යායවරිය හා භික්ෂුණී සංඝයා එකඟ විය යුතු ය. සාමණේරියක ලෙස කටයුතු කළ පැවිදි කාන්තාව (භික්ෂුණිය) ශික්ෂා මානවිකාවක ලෙස ක්‍රියා කිරීමට ද කර්ම වාක්‍යයක් කියමින් භික්ෂුණී සංඝයාගෙන් ආයාචනා කළ යුතු ය. එම ආයාචනය සහිත කර්ම වාක්‍යය තෙවරක් කිව යුතු ය. ''උතුම් සංඝයා අසත්වා. මෙම සාමණේරිය දෙවසරක් ශික්ෂාමානවිකාවක් ලෙස කටයුතු කිරීමට ඇය ද සිටින්නීය. මාගේ උපාධ්‍යායවරිය ද ඒ සඳහා අනුමැතිය ලබා දුන්නාය. එබැවින් සංඝයා විසින් ඇයට දෙවසරක් ශික්ෂාමානවිකාවක ලෙස කටයුතු කිරීමට අවසර දෙනු ලබත්වා.''

මෙම ප්‍රකාශයෙන් පසු කර්මාචාර්ය භික්ෂුණිය ඤත්ති චතුත්ථ කර්මයෙන් ශික්ෂාමානවිකා තනතුර ප්‍රධානය කිරීමට අනුමත කෙරේ.[27] ඇය ප්‍රකාශ කරන්නේ මෙවැනි අදහසකි. උතුම් සංඝයා අසනු ලබත්වා. මෙම සාමණේරිය දෙවසරක් ශික්ෂාමාවිකාවක් ලෙස ප්‍රතිපත්ති ප්‍රගුණ කිරීමට ආයාචනා කරන්නීය. ඇයගේ උපාධ්‍යායවරිය

ද එයට එකඟ වෙයි. දැන් මැයට ශික්ෂාමානවිකා තනතුරු ප්‍රදානයට සුදුසු කාලයයි. මෙය දැන්වීමකි.[28] කර්මාචාර්ය භික්ෂුණිය සිවුවරක් මෙම ප්‍රකාශය කිරීමෙන් පසු සංඝයා නිහඬ ව සිටින්නේ නම් සාමණේරියට ශික්ෂාමානවිකා පදවිය පිරිනැමේ.

මෙම විනය කර්මයට අනුව චීන භික්ෂුණීහු ශික්ෂා මානවිකා පදවියට පත් වෙති. ශික්ෂා මානවිකාවක ලෙස පුහුණුව ලබන චීන භික්ෂුණීහු ඉන් අනතුරුව උපසම්පදාව ලැබීමට සුදුසුකම් ලබති. එය උභය සංඝයාගෙන් ලබන සම්පූර්ණ උපසම්පදාවයි. භික්ෂුණීහු උපසම්පදාව ලබන දිනයෙහි කර්මාචාර්ය භික්ෂුණීන් හා උපාධ්‍යාය, ආචාර්ය භික්ෂුණීන් භික්ෂු සංඝයා වෙත ගොස් උපසම්පදාපේක්ෂක භික්ෂුණීන් උපසම්පදා කිරීම දැනුම් දිය යුතු ය. එසේ සංඝයා අතරට යන භික්ෂුණීන්ගෙන් එක් නමක් මෙසේ දන්වා සිටියි. "උතුම් සංඝයා අසනු ලබත්වා. භික්ෂුණීහු උපසම්පදාව අපේක්ෂාවෙන් සිටිති. ඔවුහු වයස අවුරුදු 20 සම්පූර්ණ කර ඇත්තීය. පා සිවුරු සම්පූර්ණ කර ඇත්තීය. දැන් ඔවුන් උපසම්පදා කිරීමට නිසි කාලයයි. [29] භික්ෂු සංඝයා විසින් මෙම පණිවුඩය අසා නිහඬව සිටින්නේ නම් භික්ෂුණී උපසම්පදාව අනුමත කළා වෙයි. එවිට සංඝයා වෙත නැවත දෙවරක් එම භික්ෂුණිය විසින් ඉහත පණිවුඩය දන්වා සිටියි. ඉන්පසු භික්ෂූන් අතර සිටින කර්මාචාර්යන් වහන්සේ නැගී සිට ඉහත භික්ෂුණිය ඉදිරිපත් කළ පණිවුඩය තෙවරක් භික්ෂූන් ඉදිරියේ ප්‍රකාශ කරයි. [30] මින් අනතුරුව උභය සංඝයා ඉදිරිපත් ව උපසම්පදාපේක්ෂක භික්ෂූන් හට උපසම්පදාව ලබා දේ. ධර්ම ගුප්ත විනයට අනුව උපසම්පදාව ඉල්ලීම සඳහා සිවුරක් ආයාචනා වාක්‍ය කීමෙන් පසු භික්ෂු සංඝයා අතර සිටින කර්මාචාර්යන් වහන්සේ භික්ෂුණී පාරාජිකා අට පැහැදිලි කර ඒවා ආරක්ෂා කළ හැකිදැයි භික්ෂුණීන්ගෙන් විමසති. එසේ ම උන්වහන්සේ නිශ්‍රය ධර්ම පිළිපැදිය හැකි දැයි විමසති.

එනම්,

I. ගොරෝසු සිවුරු පරිහරණය
II. පිඬුසිගායාම
III. වෘක්ෂමූලික වීම
IV. ගව මූත්‍රාවලින් පිළියෙළ කළ ඖෂධ පරිහරණය[31]

මෙම සියල්ලට උපසම්පදාපේක්ෂිකාවන් එකඟ වේ නම් එය ම ඔවුන්ගේ උපසම්පදාව වෙයි. මුල් වකවානුවේ චීන භික්ෂුණියක් විසින් අනුගමනය කරන ලද භික්ෂුණී විනය විවිධ බෞද්ධ නිකායයන්ට අයත් විය. එසේ වුව ද ඒවා අතර වෙනස්කම් ඉතා අවම ය. උභය සංඝයා වෙතින් උපසම්පදාව ලැබීමේ පටන් ධර්මගුප්ත විනයට ප්‍රමුඛතාව ලැබී ඇත. භික්ෂුණී විනය නීති රීති මගින් කාන්තාවන් උපසම්පදා කිරීම සඳහා අදියර තුනක් අනුගමනය කෙරේ. භික්ෂුණීන් වහන්සේලා විසින් කාන්තාවන් සාමණේරිකා හා සික්ඛාමානවිකා තත්ත්වයට පත් කරනු ලැබේ. භික්ෂු - භික්ෂුණී උභය සංඝයා විසින් සික්ඛාමානවිකාවන් උපසම්පදා කරනු ලැබේ. මෙලෙස භික්ෂුණීන් විසින් විනයානුකූලව නියමිත පුහුණුවක් ලබා දීමෙන් අනතුරුව නවක භික්ෂුණීන් උපසම්පදා කිරීමෙන් භික්ෂු භික්ෂුණී සමාජයට එක් කර ගනු ලැබේ.

තායිවානයේ බොහෝ විනයාචාර්යවරු භික්ෂුණී සංඝයා පැවිදිවීමේ පටන් උපසම්පදාව ලැබීම දක්වා ක්‍රියාවලිය *Triple Platform* උපසම්පදාව යනුවෙන් නම් කෙරේ.[32] මෙය උපාසිකා, සාමණේරී සහ සික්ඛාමානවිකා යන අවස්ථා සඳහා භාවිත කරන බව පෙනේ. කෙසේ වුව ද චීන භික්ෂුණීහු - භික්ෂූන් වහන්සේලාගේ පූර්ණ අධීක්ෂණය යටතේ සියලු කටයුතු සිදු කරනු ලබන බැව් පෙනේ.

## 6. නිගමනය

චීනයට බුදුදහම හඳුන්වාදීමෙන් අනතුරුව එරට භික්ෂු ශාසනය ආරම්භ වුවද භික්ෂුණී ශාසනය පිළිබඳ තොරතුරු වාර්තා නො වේ. කෙසේ වුවත් භික්ෂූන් වහන්සේලාගේ දර්ශනයත් උන්වහන්සේලාගේ ක්‍රියාකාරිත්වයත් චීන බෞද්ධ කාන්තාව තුළ ඇති කළ ආකල්පය අ පන් නම් කාන්තාවගේ ක්‍රියා කලාපයෙන් ප්‍රකට වේ. ඇය තිසරණ සරණ සමාදන් වූ උපාසිකාවක් වශයෙන් කෙටිකලක් ගතකොට ඉන් අනතුරුව දස සික්ෂා පද සමාදන් වූ බ්‍රහ්මචාරිණියක බවට ද පත්වූවාය. මහාප්‍රජාපතී ගෝතමිය දෙවරක් බුදුන් වහන්සේ වෙත ගොස් තමන් ඇතුලු කානතාවන්ට පැවිද්ද ලබා දෙන්නැයි ආයාචනය කොට එය නොලැබුණු කල්හි තෙවැනි වර විශාලාවේ කුක්කුටාගාර ශාලාවට පැමිණීමට පෙර ගතකළ ජීවන පැවැත්ම චීන ජාතික අ පන්ගෙන් ද පිළිබිඹු වෙයි. කෙසේ වුවත් අ පන් භික්ෂුණියක්

ලෙස සැලකිය නොහැකි ය. චීන ජාතික කාන්තාවන් පැවිදිවීම සම්බන්ධ දෙවැනි පියවර වාර්තාවන්නේ ක්‍රි. ව. (335-342) කාලවකවානුව අතර පැවති (*Hsien-kang*) ෂින් කන් යුගයේ දීය. කාශ්මීරයේ සිට චීනයට පැමිණි ඥානගිරි හිමියෝ තවත් භික්ෂූන් වහන්සේලා පිරිසක් සමග එක්වී (*Ching-chien*) චින් චෙන් ප්‍රධාන චීන ජාතික කාන්තාවන් විසිහතර දෙනෙක් සාමණේරී භික්ෂුණීන් ලෙස පැවිදි කළහ. මේ යුගය වනවිට භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය මෙන් ම මහාසංඝික නිකායේ විනය ග්‍රන්ථ චීන බසට නගා තිබුණ බැවින් මෙම පැවිද්ද භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය මෙන් ම මහාසංඝික විනය පදනම් කරගෙන භික්ෂු සංඝයා පමණක් සහභාගිවී ලබාදුන් බව පැහැදිලි ය. එසේ වුව ද මෙහි දී උපසම්පදා විනය කර්මයක් සිදුනොවුණ බැවින් භික්ෂුණී ශාසනය එරට ස්ථාපිත නොවීය. භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය මෙන් ම මහාසංඝික නිකායේ විනය ග්‍රන්ථ චීන බසට නගා තිබුණ බැවින් මෙහි දී සිදුවූයේ සාමණේරී දස ශික්ෂා පද සමාදන්වීමක් කරවීම පමණි. ක්‍රි. ව. 357 දී ඉන් දීය ජාතික ධර්මගුප්ත හිමි ඇතුලු භික්ෂු සංඝයා එක්වී (*Ching-chien*) ප්‍රධාන චීන ජාතික කාන්තාවන් ලෝයාන්හි පිහිටි උදකුක්ඛේප සීමා මාලයක දී භික්ෂුණී උපසම්පදා ලබා දී ඇත. මෙම උත්සවය පිළිබඳ දක්වෙන චීන වාර්තාවලට අනුව *Tao-chang* නම් චීන ජාතික භික්ෂුව මෙම භික්ෂුණී උපසම්පදා උළෙලට විරුද්ධ වී ඇත්තේ උභය සංඝයා නොමැතිව සාමණෙරී භික්ෂුණීන් වහන්සේලා උපසම්පදා කිරීම විනය විරෝධී වන බැවිණි. මේ උපසම්පදා උළෙලේ දී වුවද ඉදිපත් වී ඇති සාධක අනුව චීන කාන්තාවනට විනයානුකූල උපසම්පදාව ලැබුණේයැයි සැළකිය නොහැකි ය. ශ්‍රී ලාංකික භික්‍ෂුණීහු දහනම නමක් සහභාගී කරගත් අතර සංඝවර්මන් හිමි ඇතුළු භික්‍ෂූහු විශාල පිරිසක් ක්‍රි. ව. 434 දී *Nan- lin* විහාරයේ දී උභය සංඝයා වෙතින් චීන ජාතික කාන්තාවෝ තුන්සියයක් පමණ උපසම්පදාව ලැබුවෝය. මෙය පළමුවරට උභය සංඝයා වෙතින් චීන ජාතික කාන්තාවන් පැවිදි උපසම්පදාව ලැබීමයි. මෙම උපසම්පදා විනය කර්මය සිදුකල අවධිය වනවිට බොහෝ විනය ග්‍රන්ථ චීන බසට නගා තිබුණි. එවකට චීනයේ ධර්මදූත ව්‍යාපාරයේ නිරත ව සිටි සියලු භික්ෂූන් වහන්සේලා මහායානය නියෝජනය නොකල අතර උන්වහන්නසේලා හීනයාන මහායාන උභය සම්ප්‍රදාය ම නියෝජනය කළහ. ශ්‍රී ලාංකික භික්‍ෂුණීහු දහනම දෙනා වහන්සේ ම ථේරවාදී

සම්ප්‍රදායට අනුව උපසම්පදාව ලද්දෝ වූහ. උභය සම්ප්‍රදාය ම නියෝජනය කළ භික්ෂූන් වහනසේලා සහ ශ්‍රී ලාංකික භික්ෂුණීන් වහන්සේලාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ භික්ෂුණී උපසම්පදාව සඳහා භාවිත විනය නීති ථෙරවාදය ඉක්මවූයේ නම් හෝ ථෙරවාදී විනය නීතිවලට විරුද්ධ වූයේ නම් හෝ ශ්‍රී ලාංකික භික්ෂුණීහු මෙම උළෙලට සම්බන්ධ නොවනු ඇත. තවමත් චීන ශික්ෂා මානවිකාවන් උපසම්පදා කිරීම පිණිස භාවිත වන්නේ පළමු උපසම්පදාව සදහා යොදාගත් ක්‍රමවේදමය. එබැවින් ථෙරවා දී බුදුසමය ව්‍යාප්ත රටවල භික්ෂුණීන් වහන්සේලා සම්බන්ධ සියලු කාර්යයන්හි දී චීන භික්ෂුණීන්ගේ දායකත්වය ලබා ගැනිම විනය විරෝධි නොවන බව කිව හැකි ය.

**Reference:**

1 According to the Ta-sung Seng-shih Lueh (The Brief History of Buddhism in the Sung Dynasty), the first Chinese woman to become a Buddhist nun was named A-pan.

2. Dharmakala translated the Pratimoksa of Mahasanghika school In **249, Dharmakala came to China and translated part of the Mahasanghika Vinaya ... of Mahasanghika Precepts) the precepts for monks (jieben; pratimoksa) but omitted ... 6 5 It was not until the eighth century that the full Vinaya of a fifth school... while Dharmaguptaka code of 250 rules for monks (348 for nuns) is used in...**

3. The Biographies of Bhikcunîs (Pi-ch' iu-ni chuan), compiled in 516 A.D. by the monk Pao-ch' ang, record the lives of sixty-five eminent bhikcunîs. For the English translation of this text, see Kathryn Ann Tsai, Lives of the Nuns, University of Hawaî Press, 1994.

4 . During Ching-chien' s time, the Dharmagupta Karman, which describes the karma procedures for the ordination of bhikcuGîs, had already been translated, but it was probably not available in south China. The Sarvâstivâda Vinaya was the first complete version of the Vinaya to be translated which was not completed until 404 A.D. This is why Fa-shih said that the " precepts" were incomplete.

5. During thehsien-kang period (335~342 A.D.) of the Chin Dynasty, the monk Seng-chien brought back from the Central Asian kingdom of Yueh-chih the MahâsaEghika BhikcuGî Karman and the BhikcuGî-prâtimokcâ. In the first year of Sheng-ping (357 A.D.), the Indian

monk Dharmagupta was invited to Luo-yang to setup a precept platform to confer bhikcuGî ordination, but the Chinese Monk Tao-ch' ang objected on the basis of the Chieh-yin-yuan-ching (Sûtra of the origin of the Rules).[41

6. An other name for the Chieh-yin-yuan-ching is Pi-na-yeh (Vinaya), T.24. pp.851b-899c.
7. The ordination ceremony went ahead despite his objections and was performed on a ship in the middle of a river. Ching-chien together with three other women became the first bhikcuGî in China. More precisely speaking, Ching-chien was the first Chinese bhikcuGî to take the upasaCpadâ only from the bhikcu saEgha
8. The Vinaya texts that GuGavarman translated include thehsa-hsin, the Karman of the Dharmagupta Vinaya, the Brief Treatise on the Five Precepts of the Upâsaka, and the Twenty-two Precepts of the Upâsaka, etc. (T.50, p.340a).
9 . T.50, p.341b and T.50, pp.342b.
10 Kathryn A. Tsai, tr., Lives of the Nuns, p. 53.
11. In the biography of the nun Pao-hsien, the year given for this ordination is 434 C.E.
12. In the biography of the nun Pao-hsien, the year given for this ordination is 434 C.E.
13. Manji Zokuzo Kyo (Hsu Tsang Ching), Pai-ma Publisher, Taipei, vol.64, p.454.
14. Dao-hai, " Discussion of BhikcuGî Ordination and its Lineage in China: Based on Scriptures of Chinese Vinaya and Historical facts," paper delivered in the 1st Seminar of Vinaya Scholars Concerning the Lineage of BhikcuGî Ordination, Dharamsala, 3-5 August, 1998, p.18
15. For a detailed study of bhikcuGîs in T' ang Dynasty, see Yu-chen Lee, T' ang-Tai Te Pi-chiu-ni (BhikcuGîs in the T' ang),hsieh-shen Publisher, 1989.
16. The first conference was held in November, 1997 in Taipei, Taiwan. It was sponsored by the Center for Buddhist Studies at National Taiwan University. The Dalai Lama sent Geshe Tashi Tsering to attend the conference. The other participants included Chinese bhikcuGîs, bhikcus, and scholars. The discussions concentrated mainly on two topið: (1) the formation and development of the Chinese BhikcuGî lineage and (2) the difference between the vinaya systems of Dharmagupta and Mûlasarvâstivâda.The second conference was held in August, 1998 in Dharamsala. It was sponsored by the Department of Religious and Cultural Affairs of the Tibetan Government in exile and included Vinaya masters from Taiwan, the

Theravâda tradition and the Tibetan tradition. Among the invited speakers, there was only one bhikcuGî representative, apparently a very uneven ratio.

(1) Pali Cullavagga X (I.B. Horner, The Books of the Discipline, Pali Text Society, London, 1975, vol.5, pp.352-356).
(2) Madhyamâgama (T.1, pp.605a-607b).
(3) Gautamî-vyâkaraGa-sûtra (T.1, pp.856a-858a).
(4) Dharmagupta Vinaya (T.22, pp.922c-923c).
(5) MahâsaCghika Vinaya (T.22, pp.471a-471b).
(6) Mahîúâsaka Vinaya (T.22, pp.185b-186b).
(7) Mûlasarvâstivâda Vinaya (T.24, pp.350b-351a).
(8) Mahâprajâpatî Gautamî BhikcuGî Sûtra (T.24, pp.945b-947a)

17. The story of how Mahâprajâpatî became a nun can be found in the following sources:
18. I. B. Horner, The Book of the Discipline, vol.5, p.352.
19. Mânatta means joy to the penitent resulted from confession and absolution; it is also a term for penance,or punishment.
20. The Ssu-fen Lu, T.22, p.923a-b.
21. There is some debate about whether or not the eight chief rules are an accurate representation of the words of the Buddha. First, the formation of the eight rules goes against the Buddha' s general procedure for establishing precepts, which is, whenever a monk or nun did or said something improper, accordingly a precept was set up to prevent future occurrence. Second, there is evidence that at least some of the eight rules did not exist at the time that the bhikcuGî lineage was established. For example, the pâcittiya rule 52 in the Pali BhikcuGî VibhaEgha says that ‘Whichever nuns were to verbally abuse or revile a monk—this is an offence involving expiation.' (For the background of the formation of this rule, see Gregory Schopen, " The Suppression of Nuns and the Ritual Murder of their Special Dead in Two Buddhist Monastic Texts," Journal of Indian Phil£ophy, vol.24, 1996, pp.563-592.) This rule is equivalent to the second rule of the eight chief rules. If the eight rules were proclaimed before the establishment of the bhikcuGî saEgha, this pâcittya rule would not have to be proclaimed again.
22. Ssu-fen Lu (Dharmagupta Vinaya), T.22, p.925a.
23. For a detailed discussion of the need for consent of parents or husband, see I.B. Horner, Women in Primitive Buddhism, Motilal Banarsidass Publishers, Delhi, pp.174-184. The Pali Vinaya states, "Let no son, almsman, receive the pabbajjâ ordination without his father' s and his mother' s consent. He who confers the pabbajjâ

3rd Proof



ordination [on a son without that permission] is guilty of a dukkata offence." (I. B. Horner, Women in Primitive Buddhism, p.149). The Ssu-fen Lu also states, " If a bhikcuGî ordains a woman without first receiving the permission of her guardian, at that instant, her act is to be considered a sanghâvaœeca offense." (T.22, p.519b.) The "guardian" refers to the parents, husband, mother-in-law, father-in-law or uncles. According to the Therîgâthâ, it seems that this rule was cl£ely followed during the Buddha' s time. However, nowadays in Taiwan, where there is a large number of bhikcuGîs, this rule is not very strictly observed. In the case of a woman who cannot get consent from her parents or husband, it is argued that an adult woman has a legal right to act on her own behalf and make her own decision without anybody' s consent.

24 Tan-wu-te lu-pu tza che-mo (The Karma of the Dharmagupta Vinaya), T.22, pp.1047c- 1048a.

25 Ssu-fen Lu, T.22, pp.810c-p.811a. The MahâsaEghika Vinaya specifies that a "crow-chasing úrâmaGera" is between the age of seven to thirteen (T.22, p.461b).

26. Akira Hirakawa, Monastic Discipline for Buddhist Nuns, Kashhi Prasad Jayasawal Research Institute: Patna, 1982, p.299.

27. Ssu-fen Lu, T.22, p.756a-b.

28. Shih-sung Lu, T.23, p.326a.

29. T.22, p.1037c. Karma Lekshe Tsomo, Sisters in Solitude, Sri Satguru Publication: Delhi, 1997, p.54.

30. For a discussion of the œikcamâGâ precepts in the various Vinaya traditions, see Hirakawa, Monastic Discipline for the Buddhist Nuns, pp.53-54.

31. T.22, p.924b-c.

32. Nowadays in both Chinese and Tibetan Buddhist traditions, it is a common practice for the bhikcus to ordain laywomen and confer the úrâmaGerikâ vows. However, this practice is not in accord with the Vinaya.

## REFERENCES

Analayo 2005: "Some Pali Discourses in the Light of Their Chinese Parallels (2)" , *Buddhist Studies Review*, vol. 22 no. 2 pp. 93-105.

Analayo 2009: " Women' s Renunciation in Early Buddhism – The Four Assemblies and the Foundation of the Order of Nuns" , in *Proceedings of the Congress on the Bhiksuni Ordination*, T. Mohr (ed.), Wisdom Publications (forthcoming).

3rd Proof


Banerjee, Anukul Chandra 1977: *Two Buddhist Vinaya Texts in Sanskrit, Pratimoksa Sutra and Bhiksukarmavakya*, Calcutta: World Press.

Blackstone, Kathryn R. 1998: *Women in the Footsteps of the Buddha, Struggle for Liberation in the Therigath*a, Richmond: Curzon; page references are to the reprint 2000, Delhi: Motilal Banarsidass.

Blackstone, Kathryn 1999: " Damming the Dhamma: Problems with Bhikkhunis in the Pali Vinaya" , *Journal of Buddhist Ethið,* vol. 6 pp. 292-312.

Chung, Jin-Il 1998: " ‘Bhiksuni-Karmavacana' of the Mulasarvastivadins" , in *Facets of Indian Culture, Gustav Roth Felicitation Volume, Published on the Occasion of his 82nd Birth*day, C.P. Sinha (ed.), India, Patna: Bihar Puravid Parishad, pp. 420-423.

Dutt, Nalinaksha 1984: *Gilgit Manuscripts, Mulasarvastivada Vinayavastu, vol. III part 1*, Delhi: Sri Satguru.

Gethin, Rupert 2006: " Mythology as Meditation: From the Mahasudassana Sutta to the Sukhavativyuha Sutra" , *Journal of the Pali Text Society*, vol. 28 pp. 63- 112.

Heirman, Ann 2001: " Chinese Nuns and their Ordination in Fifth Century China" , *Journal of the International Association of Buddhist Studies*, vol. 24 no. 2 pp. 275-304.

Heirman, Ann 2008: " Where is the Probationer in the Chinese Buddhist Nunneries?", *Zeitschrift der Deutschen Morgenländischen Gesellschaft*, vol. 158 no. 1 pp. 105-137.

Hirakawa, Akira 1982: *Monastic Discipline for the Buddhist Nuns: An English Translation of the Chinese Text of the Mahasaghika-Bhiksuni-Vinaya*, Patna: Jayaswal Research Institute.

Hüsken, Ute 2000: "The Legend of the Establishment of the Buddhist Order of Nuns in the Theravada Vinaya-Pitaka" , *Journal of the Pali Text Society*, vol. 26 pp. 43-69.

Kabilsingh, Chatsumarn 1984: *A Comparative Study of the Bhikkhuni Patimokkha,* Delhi: Chaukhambha Orientalia.

Minh Chau, Thich 1991: *The Chinese Madhyama Agama and the Pali Majjhima Nikaya*, Delhi: Motilal Banarsidass.

Tsai, Kathryn Ann 1994: *Lives of the Nuns, Biographies of Chinese Buddhist Nuns from the Fourth to Sixth Centuries, A Translation of the Pi-ch' iu-ni chuan, compiled by Shih Pao-ch' ang*, Honolulu: University of Hawaii Press.

Tsukamoto, Zenryu 1985: *A History of Early Chinese Buddhism, From its Introduction to the Death of Hui-yüan*, L. Hurwitz (trsl.), Tokyo: Kodansha International.